# Small Business Workshop by Sri Lanka Women's Group

Written by
**Dr Kumudini Heenetigala**

Small businesses play a vital role in the national economic and social wellbeing. According to Australian Bureau of Statistics (ABS), there are approximately 1.96 million active small businesses in Australia, representing 96% of all businesses. Small businesses employ over 5 million people, accounting for around 51% of private sector employment and contribute over 1/3 of Australia's total GDP. Therefore, smallbusinesses are referred to as the "engine room" of the Australian economy.

In Australia, not only is a small business a source of economic activity but the sector is also expanding rapidly. The past two decades saw a four-fold increase in the number of small and medium enterprises (SMEs) from 577,100 in the financial year of 1983-84 to more than two million in 2007. One can equally say that one person out of ten in Australia ownsa business. SMEs accounts for about 99% of all private sector entities, while large firms never exceeded 1% of the total during 1983-2007 (Australian Bureau of Statistics 2007).
According to ABS, a small business is defined as one that employs less than 20 people and medium size business as one that employs between 20 and 200. Micro businesses are a special type of very small businesses defined by the ABS as employing less than 5 employees. However, the s45A(2) of the Corporations Act 2001 (Cth) definessmall companies as those with less than 50 shareholders, which meet at least two of the following criteria:
- consolidated revenue of less than $25 million per year;
- gross assets of less than $12.5 million;
- fewer than 50 full-time employees.

Under this definition, around 98 per cent of Australia's 1.6 million proprietary companies are classified as small.

A small business can take the legal form of a sole proprietor, a partnership or a company. Many are registered as companies and ownership is often restricted to taking the corporate form of sole proprietor or partnership. These latter forms leave the small corporations without the protection of limited liability. They have a relatively small share in the marketplace and often operate in only one location servicing local customers. They may also operate in a niche market or be part of a franchise.

Usually, they are owned by one person or a small number of individuals often linked by family ties.
They are mostly managed by owners who make all the critical management decisions and undertake many of the management functions such as financial management, personnel, marketing and production that might be distributed in a larger corporation. They are also closely associated with entrepreneurship and innovation. Because they are often operated by owners who are also theman-agers', they may undertake most management roles without the support of an internal specialist. As a result, small businesses are often dependent on other professionals such as an accountant or a lawyer for advice.

Australia has the greatest proportion of immigrants compared to Canada, USA, Switzerland, UK, France and Germany. Although Australia has experienced considerable growth since the recession of 1990-91, unemployment has been a great burden for the economy. The effect of the recent global financial crisis has resulted in increased unemployment in Australia. The migrants, especially the South Asians have arrived on the basis of their skills or family migration category. They are unable to benefit as a result of factors such as lack of proficiency in English skills, non-recognition of overseas qualifications and experience, perception of immigrants ability to communicate, direct and indirect racial discrimination, globalisation and the restructuring of Australian Industry. The above factors have contributed to unemployment of migrants resulting in emergence of a social under class when some groups are consistently unemployed.One way to address the above issue is to encourage small business creation, which will not only create employment butalso add to the GDP of the country, which is vital for the economic growth.

Studies report small businesses employ over one half of private sector workers in Australia. More than half of Small Businesses in Australia are owned and operated by first or second-generation immigrants, which is an alternative to unemployment for immigrants to Australiawho are locked out of jobs in the corporate or public sector.

Small businesses also provide employment for family members of migrants. Migrants from Non English Speaking Background (NESB) mostly rely on their family members to support in running their businesses. Over one half of the labour employed by businesses owned by women and one third of the staff of businesses owned by men from NESB are family members. This shows the employment of co-ethnics by the small businesses owned by NESB migrants.

As a result of the importance of small businesses to migrants, Sri Lanka Women's Group is hosting a workshop on "Starting Your Business". This workshop will be conducted by Small Business Victoria on the 18th May 2013 from 9.30 am to 1.00pm at Stanton Partners, Level 1, 56-58 Burwood Road, Hawthorn 3122. This is a free seminar.

To reserve a seat please contact: Kumi Heenetigala 0425864045 orSriya Jayawardena 0488005290.




තර්ජනයක් - අභියෝගයක් නොවේ.

කටුනායක දී බිත්තර ප්‍රහාරයකට සූදානම් වන්න...

මේ තර්ජනය ශ්‍රී ලංකාවේ මහා සංඝරත්නය නියෝජනය කරන භික්ෂුවක් විසින් කරන ලද බව පසුගිය දා වාර්තා විය.

තර්ජකයා ද සෙසු පටු පුද්ගලයකු නොවන බව පෙනෙයි. මට නම මතක නැත . නම කියන එක අවශ්‍ය නැත . හරිත් නැත . අප කතා කළ යුත්තේ තර්ජනයේ අරමුණ ගැන ය - හරය ගැන ය. එහි දීර්ඝ කාලීන ප්‍රතිඵල නො-හොත් ආදීනව ගැන ය.

කාට ද? මොකට ද?

# බිත්තර භික්බවෙ

*එදා පත්තු කරපු ගින්න නිවා දමන්නට වසර තිහක් ගත විය. මෙදා තව ගින්නක් පත්තු කර ගත්තොත් කොහොම හිටීවිද?*

මේ කියන තරවටුව එල්ල වී ඇත්තේ ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයන් කිහිප දෙනකුටය. සියලුම ක්‍රීඩකයන් නොයතත් සමහරුන් චෙන්නායි පවත්වන ක්‍රිකට් තරගාවලියකට සහභාගිවීමට තීරණය කර ඇත . ඒ තීරණය එකිනෙක ක්‍රීඩකයා පුද්ගලිකව ගත් එකක් බවද පෙනෙයි.

එක අතකින් මෙතැන පුද්ගලික නිදහස පිළිබඳව ප්‍රශ්නයක්ද මතුවෙයි. ශ්‍රී ලංකාවේ පුරවැසියකුට තමාට සුදුසු යයි සිතන ආකාරයේ ක්‍රියාවක නිරතවීමේ නිදහස ගැන. නිදහස අහිමිවන්නේ ඒ ක්‍රියාව තවෙකකුට හෝ සමා-ජයට හෝ හානිකර වන විටය. ඔවුන් ඉන්දියාවට ගොස් ක්‍රිකට් ගැහුවාට හානි වන හෝ පීඩාවට පත්වන කෙනෙක් නැත . ඒ රටේ පවා එබන්දන් නැත . සිටියොත් ඒ නිසා කෝපවන පිරිසක් පමණි.



ඒ කෝපවන්නෝ ද බිත්තර භික්ෂූන් වාගේම වෛරයෙන් පෙළෙන්නෝ ය. මේ දෙපක්ෂයටම අවවාද කිරීමට අපට සිදුවන්නේ අභාවප්‍රාප්ත ශ්‍රී ලංකා ජනාධිපති ජයවර්ධන උතුමාණන්වහන්සේ මළවුන්ගෙන් කූද්දා ගෙන සබයට ගෙන ඒමටය.

සුප්‍රකට සැන් ෆ්‍රැන්සිස්කෝ සාම සමුළුවේදී සකල ලෝකවාසී ජනතාව මවිතයට හා ප්‍රබෝධයට පත් කරමින් එතුමා බුදු වදන් සිහිපත් කර දුන්නේ ය.
"නහිවේරේන වේරාණි
සම්මන්තීව කුදාවනං..."

කොයි තරම් සුළු සටන් හා කැරලි හට ගත්තත් ලෝකයට තුන් වැනි මහා යුද්ධයකට මුහුණ දීමට සිදු නොවූයේ ජයවර්ධන උතුමාණන් එදා දේශණා කළ බෞද්ධ දර්ශනයේ හරය නිසා නොවේ යයි කාට නම් කිව හැකි ද?

අද අප අත්විඳින්නේ දහම් දිවයිනේ නව බොදු පුබුදුවක සුබ පල ද?

වෙනසකට ඇත්තේ මෙදා ඒ කියන පුබුදුවට මුල පුරන්නට වැලිවිට සරණංකර හෝ හික්කඩුවේ ශ්‍රී සුමංගල බඳු මහා සංඝරත්නයේ සුපිරි තරු හෝ හෙන්රි ස්ටීල් ඕල්කොට් බඳු ගිහියන් හෝ නොව ශ්‍රී ලංකා තලයේ ජනිතවූ නියම සිංහල බෞද්ධ භික්ෂූන් වහන්සේ නොවීම ය.

චෙන්නායිහිදී ශ්‍රී ලාංකික භික්ෂුවකට අතවර කිරීම මේ ප්‍රබෝධයට හේතුවක් වූ බව ද පෙනෙයි.

"ඇසට ඇසක්.. දතට දතක්.."

මේ කතාව නම් බුදු බණේ තිබෙන්නට බැරි ය.

දහ අතේ කල්පනා කරපු මට එක පාරටම මතක් වුණේ ඩී ඒ එෆ් සේනාරත්න නමැති ලේඛකයා ය. ඔහු ලියූ පොතකි. පොතේ නම භික්ෂුවට මතක තිබෙන්නට විදිහක් නැත . මට නම් මතකය.

"බුදුන් නොවදාළ ධර්මය"

සේනාරත්න පොතේ කියාපු දේවල් බොහෝ දෙනා අගය කළත් භික්ෂූන් වෙතින් පළවූයේ උපේක්ෂා සහගත නිහැඬියාවකි. ඔහු ලියූ දේ අමිහිරි වන්නට ඇත .මම ඒ අදහස් සමහරක් උපුටා දක්වමි. ඒ අදට එදාට වඩා ඔබින නිසා ය.

"අද පවතින ජාතිවාදී ගැටුම් ඇති වූයේ සිංහල රජ බස කිරීම නිසාවත් වෙනත් කිසිවක් නිසාවත් නොඑසේ නම් යමක් නොකිරීම නිසාවත් නොව කවදත් යටපත් ව පැවති භේදය අදූරදර්ශීන් විසින් ආත්ම ලාභය උදෙසා උඩට මතු කිරීමෙනි"

සේනාරත්න තව දුරටත් මෙසේ කියයි.

"ගිහියා ජාතිවාදයෙන් ආගම් වාදයෙන් රත් වී විනාශය කරා පා නගන්නට සැරසෙන විට ඔවුන්ට කරුණු වටහා දී ඔවුන් සිසිල් කිරීමේ භාරදූර වගකීම පැවරී ඇති භික්ෂූන් වහන්සේලා සමහර අවස්ථා වලදී ගිහියන්ටත් කලින්ම හුළු අතු පත්තු කර ගනිති"

ඔහු එල්ල කරන නිර්දය ප්‍රහාරය ද සළකා බැලිය යුතු ය.

"ඩඩ්ලි සේනානායක සහ එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක යනු මෑත යුගයේ මේ රටේ පහළ වූ සම්භාවනීය පුද්ගලයෝ දෙදෙනකි. තමන් උදෙසා නොව දේශය උදෙසා දේශපාලනයේ නිරත වූ උතුමන් දෙපළම එවක සිටි සම්භාවනීය දෙමළ නායකයා වූ එස් ජේ වී චෙල්වනායගම් මහතා සමග සාම ගිවිසුම් අත්සන් කිරීමට ඉදිරිපත් වූයේ මේ ජාතිවාදී උණුසුම කලකට හෝ නිවා දැමීමටය. ඒ ගිවිසුම් දෙකෙන් එකක් වත් ක්‍රියාත්මක කළේ නම් මේ රටේ ජාතිවාදී ගින්න අඩුම වශයෙන් අශක පහකට වත් යටපත් වන්නට තිබිණ. ඒ අවස්ථා දෙකේම ඒ ක්‍රියාවලිය අවුල් කර දැමුවේ සංඝයා වහන්සේලා ය. මේ හේතුවෙන් එදා මෙදාතුර ප්‍රාණ 50000 ක් වත් අකාලයේ නැසී යන්නටත් ලක්ෂ ගණනක් අනාථ වන්නටත් ඇත"

එදා පත්තු කරපු ගින්න නිවා දමන්නට වසර තිහක් ගත විය. මෙදා තව ගින්නක් පත්තු කර ගත්තොත් කොහොම හිටීවිද?

සියළු සත්වයෝ නිදුක් වෙත්වා.. නීරෝගී වෙත්වා...

අන්තර්ජාලයෙන් සන්නස
www.sannasa.net හෝ www.sannasa.com